# ජාතික පාසල් පවුර - ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
## පළමු වාර පරීක්ෂණය - 2019

ජාතිකපාසල්පවුර, ශ්‍රී ජයවර්ධනපුරඅධ්‍යාපනකලාපය - ජාතිකපාසල්පවුර, ශ්‍රී ජයවර්ධනපුරඅධ්‍යාපනකලාපය - ජාතිකපාසල්පවුර, ශ්‍රී ජයවර්ධනපු

| 7 ශ්‍රේණිය | ගණිතය | කාලය - පැය 02 යි |
|---|---|---|

ජාතිකපාසල්පවුර, ශ්‍රී ජයවර්ධනපුරඅධ්‍යාපනකලාපය - ජාතිකපාසල්පවුර, ශ්‍රී ජයවර්ධනපුරඅධ්‍යාපනකලාපය - ජාතිකපාසල්පවුර, ශ්‍රී ජයවර්ධනපු

නම - ........................................................................................................

### I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) සෘජුකෝණාස්‍රයක ද්විපාර්ශ්වික සමමිති අක්ෂ ගණන කීයද?

2) "දක්ෂ සිසුන්" කුලකයක් ලෙස හැඳින්විය හැකිද? පිළිතුරට හේතු දක්වන්න.

3) ඉරට්ටේ සංඛ්‍යාවක් මෙන්ම ප්‍රථමක සංඛ්‍යාවක් ද වන අගය කුමක්ද?

4) $y^4$ දර්ශකය කුමක්ද? එහි පාදය කුමක්ද?

5) 18 හි සාධක 2 ක් ලියන්න.

6) 2020 – 03 – 02 දින සඳුදා දවසක් නම් 2020 – 02 – 27 දිනය කවදා දවසක්ද?

7) 2 හා 5 යන ඉලක්කම් දෙකෙන්ම බෙදෙන සංඛ්‍යා තෝරා යටින් ඉරි අඳින්න.
2014 , 3425 , 6520 , 7328 , 8360

8) ක්‍රි.ව. 1919 අයත් වන්නේ කී වැනි සියවසටද?

9) 3165 හි ඉලක්කම් දර්ශකය ගණනය කරන්න.

10) 53 ☐ යන ස්ථාන තුනකින් යුත් මෙම සංඛ්‍යාව ඉතිරි නැතිව 4 න් බෙදේ. හිස් කොටුවට ගැළපෙන ඉලක්කම් මොනවාද?

11) ආරෝහණ පිළිවෙලට ලියන්න. $\frac{1}{4}, \frac{1}{3}, \frac{1}{5}$

To download past papers visit
www.vajirapani.blogspot.com

12) ඝනකයක මුහුණතක හැඩය කුමක්ද? ඝනකයකට එවැනි මුහුණත් කීයක් තිබේද?

325 - අනුරා

13) ධන හෝ සෘණ හෝ නොවන නිඛිලය කුමක්ද?

14) ත්‍රිකෝණ සංඛ්‍යාවක් මෙන්ම සමචතුරස්‍ර සංඛ්‍යාවක් ද වන සංඛ්‍යාවක් ලියන්න.

15) අගය සොයන්න. $0.5 + 0.73$

16) නිවැරදි සංකේතය වරහන් තුළින් තෝරා හිස් තැනට යොදන්න. (<, >, =)

$2^3$ ............. $3^2$

17) සුළු කරන්න. $6 \times 5 \div 2 - 1$

18) පහත ඇති සංඛ්‍යාව 9න් ඉතිරි නැතිව බෙදේ. හිස් තැනට සුදුසු ඉලක්කම ලියන්න.

2 ..................... 53

To download past papers visit
www.vajirapani.blogspot.com

19) $5^2a^3$ යන ප්‍රකාශනය ගුණිතයක් සේ විහිදුවා ලියන්න.

20) මෙම ප්‍රකාශනයේ හිස්තැන් පුරවන්න.

"2 න් 3 න් හා 4 න් ඉතිරි නැතිව බෙදෙන කුඩාම සංඛ්‍යාව .................. වේ. එය 2, 3 හා 4 හි ............. ලෙස හැඳින්වේ."

$(M = 2 \times 20)$

## II කොටස

- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට වෙනම කොළයක පිළිතුරු සපයන්න.

1) a) පියවර සහිතව සුළු කරන්න.

   i. $9 \times 5 + 18$

   ii. $16 \div 8 \times 10$

   iii. $90 - 9 \times 9 + 4$

   iv. $56 \div (7 \times 4)$ (ල 2×4)

   b) i. 32, පාදය 2 වූ දර්ශක අංකනයෙන් ලියන්න. (ල 02)

   ii. $2^3 + \square^2 = 33$, නම් හිස්තැනට ගැළපෙන අගය ලියන්න. (ල 02)

   iii. $x = 2$ හා $y = 3$. වේ නම් $2x^3y$ හි අගය පියවර සහිතව සොයන්න. (ල 04)

2) a) B = { "KOTTAWA" යන වචනයේ අකුරු}

   i. ඉහත කුලකය අවයව සියල්ල සඟල වරහන් තුළ ලියා දක්වීමේ ක්‍රමයෙන් ලියන්න. (ල 02)

   ii. කසුනි B = {KOTTAWA} ලෙස ලියා තිබිණි.
   ඇය සිදුකර ඇති වැරදි මොනවාද? (ල 02)

   iii. ඉහත කුලකය වෙන් රූප සටහනක් මගින් දක්වන්න. (ල 02)

   iv. වෙන් රූප සටහන් ඇඳී හඳුන්වාදුන් ගණිතඥයා කවුරුන්ද? (ල 01)

   b) පහත දක්වෙන කුලක නිශ්චිතව හඳුනාගත හැකි පොදු ලක්ෂණයක් මගින් ලිවීමේ ක්‍රමයෙන් ලියා දක්වන්න.

   i. A = {6 , 12 , 18}

   ii. C = {2 , 4 , 6 , 8 , ........} (ල 2 × 2)

To download past papers visit
www.vajirapani.blogspot.com

3) i. 24 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න. (ල 02)

   ii. 36 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න. (ල 02)

   iii. (i) හා (ii) ඇසුරින් 24 හා 36 හි මහා පොදු සාධකය සොයන්න. (ල 02)

   iv. ඔබ කැමති ක්‍රමයකින් 24 හා 36 හි කුඩාම පොදු ගුණාකාරය සොයන්න. (ල 02)

   v. (i) කොටස ඇසුරින් 24 හි සාධක 6ක් සොයන්න. (ල 03)

4) i. කාලය මැනීමට යොදාගන්නා ඒකක 2ක් ලියන්න. (ල 02)

   ii. එකතු කරන්න.

| | අවුරුදු | මාස | දින |
|---|---|---|---|
| | 10 | 6 | 14 |
| + | 4 | 6 | 18 |

(පිළිතුරු පත්‍රයට පිටපත් කරන්න.) (ල 03)

iii. 1931-05-10 දින ආරම්භ කළ රෝහලකට සියවසක් පිරෙන්නේ කවදාද? (ල 01)

iv. එසේ සියවසක් පිරෙන දිනට 2019-03-15 දින සිට තව කොපමණ කාලයක් තිබේද? (ල 03)

v. ක්‍රි.ව. 1296 ට පසුව යෙදෙන ප්‍රථම අධික අවුරුද්ද කුමක්ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල 02)

5) a) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් (+5) + (-3) හි අගය සොයන්න. (ල 04)

b) සංඛ්‍යා රේඛාව භාවිතා නොකර අගය සොයන්න.

i. (-3) + (-7) =

ii. (-12) + (+3) =

iii. (-1) + (+8) =

iv. (+2) + (-2) = (ල 1 × 4)

c) හිස්තැන්වලට සුදුසු අගයන් යොදන්න.

i. $(+3) + (-5) + (\quad) = 0$

ii. $(-8.1) + (\quad) = (-9.2)$

iii. $\left(+\frac{4}{5}\right) + (\quad) = \left(+\frac{1}{5}\right)$ (ල 1 × 3)

6) a) පන්ති කාමරයේ දැකිය හැකි සමාන්තර දාර සහිත වස්තූන් දෙකක නම් ලියන්න. (ල 02)

b) i. සරල රේඛා ඛණ්ඩයක් ඇඳ AB ලෙස නම් කරන්න. (ල 01)

ii. AB ට ඉහළින් AB ට ලම්බ දුර 3.5 cm. ක් වන සේ පිහිටි P නම් ලක්ෂ්‍යයක් ලකුණු කරන්න. (ල 02)


iii. P හරහා AB ට සමාන්තර රේඛාවක් ඇඳ සමාන්තර බව ලකුණු මගින් දක්වන්න. (ල 02)

iv. ඒ ආකාරයටම AB ට පහළින් AB ට සමාන්තර වූ සරල රේඛාව අඳින්න. (ල 02)

v. ඉහත සමාන්තර රේඛා ඇඳීම සඳහා ඔබ යොදාගත් ගණිත උපකරණ දෙක නම් කරන්න. (ල 02)

To download past papers visit
www.vajirapani.blogspot.com

7) a)




මෙම කෝණයේ

i. බාහු (ල 01)

ii. ශීර්ෂය (ල 01)

ලියා දක්වන්න.

b) කෝණ මානය භාවිතයෙන් පහත දී ඇති කෝණ ඇඳ නම් කරන්න. විශාලත්වය අනුව ඒවා අයත් කෝණ වර්ගය ද ලියන්න.

i. $P\hat{Q}R = 65^0$

ii. $A\hat{B}C = 120^0$

iii. $X\hat{Y}Z = 300^0$ (ල 3 × 3)